# ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය අධ්‍යයනය සඳහා වැදගත් වන ආකාරය

පූජ්‍ය. වැකඳවල අමිතරතන හිමි

ඉතිහාසය අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. amitharathana123@gmail.com

ප්‍රමුඛ පද - ඉබ්බන්කටුව, සුසාන, යකඩ යුගය, සමාජය, සංස්කෘතිය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගකරණය දෙස බලන විට ප්‍රාථමික යකඩ යුගයට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. පූර්ව ඓතිහාසික යුගයේ ආරම්භයේ සිට ක්‍රමික ව ශිලා තාක්ෂණයත් සමඟ ම මුහුවී යකඩ තාක්ෂණය පැන නගින ආකාරය පිළිබඳ ව යම් අවබෝධයක් මෙ මඟින් ලබාගත හැකි ය.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය පිළිබඳ සාධක සපයන ඉතා වැදගත් සුසාන සංකීර්ණයකි ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය. ඉබ්බන්කටුව සුසාන නිර්මාණය කර ඇති තාක්ෂණය, සුසාන වර්ගීකරණය, සුසාන අභ්‍යන්තරය හා ඉන් හමුවන විවිධාකාර පුරාවස්තු පිළිබඳ ව මෙහි විස්තර කර ඇත. එම පුරාවස්තු ඇසුරු කරගනිමින් ප්‍රාථමික යකඩ යුගය පිළිබඳ අධ්‍යනය කළ හැකි ආකාරය දක්වා ඇත. මෙතෙක් හමුවී ඇති ප්‍රාථමික යකඩ යුගයට අයත් විවිධ ක්ෂේත්‍ර ඇසුරින් මෙම යුගයේ පොදුවේ දැකිය හැකි සංස්කෘතික ලක්ෂණ මොනවාද යන්න දක්වා ඇත. එම ලක්ෂණ සමග ගලපා ඉබ්බන්කටුව සුසාන සංකීර්ණ තුළින් සපයන සාධක මඟින් තවදුරටත් ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය පිළිබඳ පවත්නා තොරතුරු තහවුරු කරගත හැකි අතර අලුතින් එකතු විය යුතු සංශෝධනය විය යුතු කරුණු ඒ ආකාරයට යාවත්කාලීන කරගත හැකි ය. ඒ පමණක් නොව විවිධ ප්‍රදේශවලින් විවිධ රටවලින් මෙම යුගයට අදාල ව හමුවන අනෙකුත් සුසාන සංකීර්ණයන් හා ඒවායේ තාක්ෂණය, විවිධ වර්ගීකරණයන් සුසාන අභ්‍යන්තරය හා බාහිර පරිසරය මෙන් ම ඒවා තුළින් ලැබෙන පුරාවස්තු සමඟ සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමේ හැකියව ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය ආශ්‍රිත ව සිදුකළ හැකි ය. විශේෂයෙන් ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය පිළිබඳ කරුණු විමසීමේ දී ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය තුළින් සමකාලීන සමාජීය, සංස්කෘතික පරිසරය පිළිබඳ ව යම් අවබෝධයක් ලබාගැනීමට බලාපොරොත්තු වෙමි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ අරමුණ හා ගැටළුවට අනුව දත්ත එක්රැස් කිරීම සඳහා පුරාවිද්‍යා ගවේශනයන්ට අමතර ව සාහිත්‍ය මූලාශ්‍ර දත්ත සඳහා ද අවධානයක් දක්වා ඇත. මෙහි දී පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් සිදු කළ අධ්‍යයන වාර්තා ද උපයෝගී කරගෙන ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය තුළ විශාල හා කුඩා ප්‍රමාණයේ සුසාන මෙහි දැකිය හැකි ය. ඉබ්බන්කටුව සුසාන අතර කුටීර දෙක, තුන සහිත සුසාන ද කාමර කීපයක් සහිත පොකුරු සුසාන ද දැකිය

හැකි ය. මේ මඟින් බොහෝ සමාජයේ විවිධ පන්ති ස්තරයන් නියෝජනය කරන විද්වත් මතය වේ. විශේෂයෙන් ම විශාල සුසානයන් සමාජයේ නායකයන් වැනි සමකාලීන සමාජයේ උසස් යැයි සැලකූ මිනිසුන් මිහිදන් කිරීම සඳහා භාවිත කරන්නට ඇති බව උපකල්පනය කරන අතර පොකුරු ඒවා ඔවුන්ගේ කුල හීන පංතියට අයත් ඔවුන්ගේ දැසි දස්සන් සඳහා වෙන්කරන්නට ඇති බවට අදහසක් පවතී. මෙම සුසාන ඍජුකෝණාස්‍රාකාර ගල් පතුරු හරස් කොට තනන ලද ශිලා මංජුසා වන අතර සුසාන අභ්‍යන්තරයේ සකපෝරුව ආධාරයෙන් නිර්මාණය කරන ලද බරණිවල හෝ කලස්වල මිනී අළු හෝ මිනිස් ඇට සැකිලි අවශේෂ තැනින් තැන තිබී ඇත. ඉබ්බන්කටුවෙන් ලබාගත් අඟුරු සාම්පල අවුරුදු 2700ට වඩා පැරණි බව ජර්මනියේ ජාතික විද්‍යා පර්යේෂණ ආයතනය මගින් කළ පර්යේෂණ වලින් පැහැදිලි වී ඇත.

ඉබ්බන්කටුව සුසානවල පියන් ගල් මත හා මැටි බඳුන් මත සංකේත දක්නට ලැබීම විශේෂත්වයකි. මෙම පියන්ගලක් මත හමු වී ඇති චතුරස්‍රාකාර සංකේතය පූර්ව බ්‍රාහ්මී 'බ' අක්ෂරයට සමාන බවත් එ වැනි ජ්‍යාමිතික රූපයක් වයඹ පළාතේ කඩිගාව කටාර සහිත ගල්ලෙනකින් හමුවී ඇති බවත් ආචාර්ය පියතිස්ස සේනානායක වාර්තා කර ඇත. මේවා ආසියාවේ හමුවී ඇති පැරණිත ම ශිලා අක්ෂර විය හැකි බව රාජ්සෝමදේව ගේ අදහසයි. සෙනරත් පරණවිතාන ගේ අදහස වන්නේ මෙම සංකේත ඉන්දියාවේ මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරයෙන් සොයාගත් මැටි පුවරුවල අක්ෂරවලට සමීප බවක් දක්වන බවයි.(divaina, 2010). එ පමණක් නොව මහාචාර්ය සුදර්ශන සෙනෙවිරත්නගේ අදහස වන්නේ මෙසේ පියන්ගල් මත හමුවී විවිධ ජ්‍යාමිතික සංකේත මඟින් කිසියම් ජනකණ්ඩායමක්, වංශාවලියක්, වෙළඳ ශ්‍රේණියක්, ගෝත්‍රයක් පිළිබඳ අදහසක් ගම්‍ය වන බවයි. එනම්, මෙම සංකේත ගෝත්‍රවල තෝටමයක් ලෙස හඳුනාගැනීම වන අතර එය ගෝත්‍රයට අනන්‍ය වූවක් බවයි. මේ අනුව බලන විට මේ පිළිබඳ විවිධ මතිමතාන්තර පැවතියත් මින් යකඩ යුගයට අදල ව මෙ රට වර්ධනය වෙමින් පැවති කිසියම් සංනිවේදන ක්‍රමයක් පිළිබඳ ව විශ්වසනීය සාධක අනාවරණය විය හැකි අතර මෙම භෂ්මාවශේෂවලට අනන්‍යතාව හඳුනාගත හැකි යම් ක්‍රමවේදයක් ලෙස මෙය පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

ලංකාවේ ප්‍රාථමික යකඩ යුගය පිළිබඳ ඍජු සාධක ලැබෙන තවත් වැදගත් අංගයකි, මිනිස් අවශේෂ තැන්පත් කර ඇති මංජුසා හා බරණි ආශ්‍රිතව පවතින කුඩා මැටි බඳුන්. මේවායේ වැදගත් ලක්ෂණය වන්නේ මියගිය පුද්ගලයා භාවිතා කරන ලද හෝ සමකාලීන සමාජ සංස්කෘතික පරිසරය නිරූපණය කරන භාණ්ඩ හා උපකරණ තැන්පත් කර තිබීමයි. ඉබ්බන්කටුව සුසානයේ පමණක් එ වැනි මැටි බඳුන් 180 ක හා වළං කැබළි 14,000 පමණ හමු වී ඇත. ඒවා තුළ තිබී සුවඳ විලවුන් , පබළු, තඹ වලින් නිමකරන ලද මි. මි. 190 ක් දිගැති අන්ජනකූරක්, ලෝහ පළඳනා, සත්ත්ව ඇටකටු, ඇත් දළවලින් සකසන ලද භාණ්ඩ, ඊ හිස්, යකඩ කැබලි වැනි මානව කෘති රාශියක් අනාවරණය වී ඇත. සුසානයෙන් හමුවී ඇති පබළු වර්ගවලින් වැඩි ප්‍රමාණයක් ඇගේට්, කානීලියන්, ඛනිජ වර්ගවලින් (සෙනෙවිරත්න, 1996, 188-190). නිමවා ඇති බව පෙනේ. මහාචාර්ය ඔස්මන්ඩ් බෝපේ ආරච්චිගේ අදහස වන්නේ උක්ත ඛනිජ වර්ග ලංකාවේ දැකිය නොහැකි අතර නිසැක වශයෙන් ම ඒවා වයඹදිග හෝ නැගෙනහිර ඉන්දියාවෙන් ආනයනය කරන්නට ඇති බව යි.

මෙම සුසාන ඇසුරින් විවිධ ආභරණ විවිධාකාර මාදිලිවලින් ලැබී ඇත. ඇත් දළ, පබළු, රන් ආලේප කරන ලද පබළු ඇටයක් මෙන් ම පබළු මාල මීන් හමු වී ඇත. එ පමණක් නොව ඊජිප්තුව, මෙසපොතේමියාව, ඉන්දු නිම්නය වැනි ශිෂ්ටාචාරවල කාන්තාවන් ඇහිබැම යට අන්ජන ආලේප කිරීමට භාවිතා කළ තඹ කුරුවලට සමාන තඹ කුරු ලැබී ඇත. මෙවාට සමාන තඹ කුරු දක්ෂිණ භාරතයේ කොහිල් (Kohil) නම් තඹ කුරුවලට සමාන බව පැවසේ. එ පමණක් ද නොව මීට අමතර ව ලංකාවේ කඳුකරයේ බහුල ව ඇති ෆෙල්ස්පාර්, මිනිරන්, ඇමතේස්ත වැනි ඛනිජ වර්ග ඉබ්බන්කටුව නිවැසි ජනතාව භාවිත කළ බව මේ පිළිබඳ වැඩිදුරටත් කරන ලද පර්යේෂණවල අනාවරණය වී ඇත. මේ අකාරයට ඉබ්බන්කටුව සුසාන සංකීර්ණය තුළ වූ **කුටීර තුනක් සහිත සුසානයකින්** සමකාලින ඉබ්බන්කටුව වාසීහුගේ සමාජ සංස්කෘතික තොරතුරු රැසක් ගම්‍ය මාන වේ.

මෙ වැනි වැළලුම් චාරිත්‍ර වාරිත්‍ර ලංකාවේ පමණක් නොව ක්‍රි. පූ. 3250 - 1500 අතර කාලපරාසය තුළ වයඹ දිග ඉන්දියාවේ හරප්පා ශිෂ්ටාචාර වාසීහු ද අනුගමනය කළ බවට සාක්ෂි තිබේ. ඉන්දු නිම්න සභ්‍යත්වයට අයත් සුසානවල මිනිය පුළුස්සා අස්ථි බරණිවල බහා වැළලීමේ චාරිත්‍රයක් හා මියගිය පුද්ගලයා එදිනෙද භාවිතකළ ආභරණ, උපකරණ, ප්‍රතිමා කලස්වල බහා තැන්පත් කිරීමේ චාරිත්‍රයක් පැවති බවට මෙම සුසාන පිළිබඳ පර්යේෂණ කළ සර් ජෝන්මාසල්, මෝර්ටිමර් වීලර් වැනි ඉංග්‍රිසි පුරාවිද්‍යාඥයින් විසින් සොයාගෙන ඇත. මේ තුළින් ඉන්දු නිම්නය හා ලංකාව අතර යම් සබඳතාවක් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි නමුත් ලැබී ඇති සාක්ෂි ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව සඳහන් කළ යුතු ය. කෙසේ වුවද මේ අනුව පෙනීයන්නේ ලංකාවාසීන් අතර මරණින් මතු ජීවිතය ගැන හෝ පුනරුප්පත්තිය පිළිබඳ ව කිසියම් අවබෝධයක් තිබෙන්නට ඇති බවයි. එසේත් නැතිනම් සිය මුතුන් මිත්තක් පිදීමේ යම් සිරිතක් ප්‍රචලිතිව පැවති බව උපකල්පනය හැකිය.

මෙම සොහොන් බිමෙන් හමු වී ඇති විදේශයන්ගෙන් ආනයනය කන ලද සුවඳ විලවුන්, පබළු මාල, අඤ්ජන කුරු, රත්රන් නළල් පටිය වැනි පුරාකෘතිවලට අනුව ද කාමර දෙක තුන සහිත සුසාන නිවාසවලට අනුව ද මෙහි වැළලූ අයවලුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් සුඛෝපබෝගී ජීවන රටාවකට හුරුවී සිටි සාමාජයේ විශාල රාජ්‍ය හා ආර්ථික බලයක් හිමිව සිටි ප්‍රභූ පිරිසකට අයත් බවට සිතීම අසාධාරණ නොවේ. එපමණක් නොව ඔවුන් විදේශ රටවල් සමඟ වෙළඳ ආර්ථික කටයුතු සිදුකරන්නට ඇති බව ඉබ්බන්කටුව සොහොන් බිමෙන් ලැබී ඇති පබළු වර්ග සහ සමහරක් රූපලාවන්‍ය ද්‍රව්‍යවලින් ගම්‍යමාන වනවා මෙන්ම මොවුන් අතර තවදුරටත් වර්ධනය වූ ගනුදෙනු ක්‍රමයක් මොවුන් අතර පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


මෙන්ඩිස්, ඩී. තුසිත. (2002) ***අපේ සම්පත් පරිහරණයේ ඉතිහාසය.*** වැළිපිල පුරාවිද්‍යා සඟරාව. පස්වෙනි කලාපය. 2001/2002. එකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය. මධ්‍යම සංස්කෘතික අරමුදල.

සෙනෙවිරත්න, සුදර්ශන් (1996) (සිංහල පරිවර්තනය පර්යන්ත ප්‍රදේශ හා ආන්ත්‍රික ප්‍රජාවෝ). ***ශ්‍රී ලංකාවේ මුල් අයිස් සමයේ ද්‍රව්‍ය හා සමාජ සැදුම් පිළිබඳ විකල්ප තේරුමක් කරා.*** පුරාවිද්‍යා අංශය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ලගමුව, ඒ. (2000) ***ප්‍රායෝගික ක්ෂේත්‍ර පුරාවිද්‍යාව.*** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ,

http://www.divaina.com [Accessed 25th July 2010].